# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2479/21 - 2026 මාර්තු මස 09 වැනි සඳුදා - 2026.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධනය අනුව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2අ) වගන්තිය යටතේ පළාත් සභා රාජ්‍ය සේවාවේ බලතල පැවරීමේ නියෝගය.

1990 අංක 28 දරන පාළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධනය අනුව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2අ) වගන්තිය අනුව උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025.09.29 දින අංක 2024/01දරන උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලබා දී ඇති නියෝගය අනුව උතුරු පළාත් රාජ්‍ය සේවා වලට උචිත පත්වීම්, ස්ථානමාරු, තනතුරෙන් පහකිරීම හෝ සේවාවෙන් ඉවත් කිරීම සහ විනය පාලනය කිරීම පිළිබඳ බලතල අතර මේ සමග අමුණා ඇති සටහන 01 දී සඳහන් පරිදි බලතලය 1990 අංක 28 දරන පාළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධනය අනුව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2අ) වගන්තියේ සඳහන් කර ඇති විධිවිධාන වලට අනුකූලව මෙහි ඉහත සඳහන් සටහනේ III වන තීරුවේ පත්වීම්, ස්ථානමාරු හා සේවාවෙන් ඉවත් කිරීම සහ විනය පාලනය කිරීම පිළිබඳව පවරන ලද බලතලයද සඳහන් කර ඇති අතර එම සටහනේ II වන තීරුවේ රාජ්‍ය සේවා නිලධාරින්ගේ වර්ගයද සඳහන් කර ඇති අතර මේ පිළිබඳ බලතල පවරන ලද නිළධාරින් ද සටහනේ I වන තීරුවේ ද සඳහන් කරන ලදී.

කෙසේවෙතත් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද මෙම බලතල පැවරීම පිළිබඳව හෝ අදාළ බලතල ක්‍රියාත්මක කරවීම පිළිබඳව කිසියම් ප්‍රශ්න එලඹෙනවිට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය ද ස්ථිර හා අවසන් තීරණය විය යුතුයි.

උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පළාත් ප්‍රධාන ලේකම් හෝ යම් බලධරයාට මේ මගින් පවරනු ලබන බලතලය ක්‍රියාත්මක කරන විට එම බලධාරියා විසින් කරනලද සියලු තීරණයන් ද 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධනය අනුව 1987 අංක 42 දරන පළාත්සභා පනතේ 32(2අ) වගන්තියේ විධිවිධාන වලට යටතේ ක්‍රියාත්මක කළ යුතු බව මෙම කොමිෂන් සභාව නියෝග කරයි.

ඉහත සඳහන් බලතල උතුරු පළාත් සභාවේ රාජ්‍ය සේවයේ නිරතවන යම් නිලධාරියෙකුට ලබා දී ඇතත් එම නිලධාරින් විසින් තමන්ට පවරන ලද බලතල ක්‍රියාත්මකවන සියලු අවස්තාවක දී ම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (3) වගන්තිය අනුව උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සකස් කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම, ස්ථාන මාරු කිරීම, උසස් කිරීම පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා සඳහා ඇති ආයතන පටිපාටියේ රෙගුලාසිවලට හා ආයතන සංග්‍රහයට අනුකූලව සහ උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණ කරනු ලබන යම් කොන්දේසි, නියෝග, රෙගුලාසි හෝ වෙනත් කාර්යයපටිපාටිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු බව මෙම කොමිෂන් සභාව මෙහි තවත් විශේෂයෙන් ම නියෝග කරයි.

තවද මෙහි සඳහන් පරිදි ලබාදෙන බලතල ද ක්‍රියාත්මක කිරීමේ දී අතෘප්තිමත් වන පාර්ශ්වයන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචන ඉදිරිපත් කිරීමට අයිතිය ඇති අයෙකි. තවද සටහන I වයතේ සඳහන් බලතල වලට අමතරව උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරන ලද 2024/01 අංක දරන 2025.09.29 දිනයේ බලතල පැවරීම අනුව පහත සඳහන් බලතල ද උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන බවද මෙයින් දන්වා සිටිමි.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද සමස්ථ දිවයිනේ සේවා හැර උතුරු පළාතේ සියලු රාජ්‍ය සේවා නිළධාරීන්ගේ බඳවාගැනීම, අන්තර්ග්‍රහනය කිරීම හා නිදහස් කිරීම (පළාතෙන් පිටතට) යනාදි බලතලය තමන්ගේ බාරව තබාගනියි.

එමෙන්ම උතුරු පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටන විධායක ශ්‍රේණියේ නිළධාරින්ගේ (පළාත් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, පළාත් සහකාර ඉඩම් කොමසාරිස් පළාත් ජීව වෛද්‍ය ඉංජිනේරුවරුන්, විශේෂ ශ්‍රේණියේ සේවයේ ක්ෂේත්‍ර/කාර්යාලීය පදනමේ සිටින නිළධාරින්, හෙද සේවාව, වෛද්‍ය විෂයන් පිළිබඳ වෘත්තියමය විශේෂඥ සේවාව, උප වෛද්‍ය සේවාව ආදී සේවාවලින් විශේෂ ශ්‍රේණියේ නිළධාරින්, දෙපාර්තමේන්තුවේ විශේෂ ශ්‍රේණියේ නිළධාරින් (ප්‍රාථමික මට්ටම හැර) පුහුණු නිළධාරින් (පුද්ගලික කාර්ය මණ්ඩලය) පළාත් කළමනාකරණ සේවා නිළධාරින්ගේ අති විශේෂ ශ්‍රේණියේ ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ විශේෂ ශ්‍රේණියේ නිළධාරින් පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික සේවයේ II වන පන්තිය පාළාත් බදු තක්සේරු නිළධාරින්) පත්වීම, විනය පාලනය කිරීම හා තනතුරෙන් ඉවත්කිරීම යන ක්‍රියාවලියට අදාළ බලතල ද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතට පවරන ලදී.

කිසියම් නිළධාරියෙකුගේ කොන්ත්‍රාත් පදනම් මත පත්වීම පළාත් රාජ්‍ය සේවයේ කොන්ත්‍රාත් පදනම් මත නැවත පිහිටුවීම යන ආදියේ ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවයන් මත ක්‍රියාත්මක කිරීම සඳහා බලතල ද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරන ලදී.

**අභියාචනය**

උතුරු පළාත් රාජ්‍ය සේවයට අදාළ යම් නිළධාරින්ට උතුරු පළාත් රාජ්‍ය සේවයේ ප්‍රධාන ලේකම් හෝ අනිකුත් නිළධාරින්ගේ තීරණය හෝ නියෝගය මගින් අසාධාරණයක් ඇති වුවවොත් එබඳු තීරණය හෝ නියෝගයට එරෙහිව පවරා ඇති බලතල සීමාවතුළ උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතට අභියාචන කළ හැක.

එසේම කරන ලද තීරණය හෝ නියෝගය අවශ්‍යතාව ඇතොත් සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට හෝ නිවැරදි කිරීමට හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අවධානයට ගත හැක.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් කර උතුරු පාළාත් රාජ්‍ය සේවයේ තනතුරට නිදහස් කරනු ලබන නිළධාරීන්ගේ අභියාචනය පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබෙන බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2003.12.02 දිනයේ අංක 04/03 දරන චක්‍රලේඛයේ සඳහන් කර ඇත.

උතුරු පළාත් රාජ්‍ය සේවයට අදාළ යම් නිළධාරියාට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන ලද තීරණයෙන් අසාධාරණයක් සිදුවී ඇත්නම් එවැනි පවරනලද බලතල යටතේ එම තීරණයට එරෙහිව මසක කාලය තුළ ගරු ආණ්ඩුකාරතුමා වෙත අභියාචනය කළ හැක.

ගරු ආණ්ඩුකාරතුමා ද එවැනි අභියාචනය ලැබූ වහාම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33(8) වගන්තිය යටතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දී ඇති බලතලයට අනුකූලව නියෝගයක් පළ කරයි.

දීප ව්‍යාප්ත සේවයට අදාළ නිළධාරින්ගේ අභියාචනය ද 1993.04.23 දිනයේ අංක 56/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යටතේ සීමිත ක්‍රියාකාරයට යටත්විය යුතුයි.

උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පළකරන ලද 2025.09.29 දිනයේ අංක 2024/01, 2025.12.31 දිනයේ අංක 2024/01 - Amendment I දරන නියෝග සටහන අනුව ඉහත සඳහන් බලතල පැවරීම 2025.11.15 දිනය සිට ක්‍රියාත්මක වන බවත් මීට පෙරාතුව පවරනලද බලතල යටතේ කරන ලද හෝ කරඇති බව සැහීමට පත් කටයුතු වලට ද පටහැනි නොවන පරිදි පෙර පැවරී ඇති බලතල ද මෙයින් අවලංගු කරනු ලබන බවත් වැඩිදුරටත් දන්වන ලදී.

**රුබිනි වරදලිංගම් මිය,**
සභාපති,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 නොවැම්බර් මස 11 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
393/48, කෝවිල පාර,
යාපනය.

උපලේඛනය I

| *තීරුව I*<br>*බලතල පවරා ඇති නිලධාරීන්* | *තීරුව II*<br>*බලතල පවරා ඇති නිලධාරීන්* | *තීරුව III*<br>*පවරා ඇති බලතල* |
|---|---|---|
| ප්‍රධාන ලේකම් | i. ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>ii. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය<br>iii. ශ්‍රී ලංකා සැලසුම් සේවය<br>iv. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය<br>v. ශ්‍රී ලංකා වාස්තු ශිල්පි සේවය<br>vi. ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය<br>vii. ශ්‍රී ලංකා ප්‍රමාණ මැනුම් සේවය | a. තනතුර සඳහා පත්වීම<br>b. ස්ථාන මාරුව<br>c. පූර්ව පරීක්ෂණය පැවැත්වීම |
| | i. පළාත් කළමනාකරණ සේවා නිලධාරීන්ගේ අති විශේෂ ශ්‍රේණිය<br>ii.ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ විශේෂ ශ්‍රේණිය | a. තනතුර සඳහා පත්වීම<br>b. ස්ථාන මාරුව |
| | i. පළාත් බඳු නිලධාරීන්<br>ii. භාෂා පරිවර්තක සේවය<br>iii. මාණ්ඩලික නොවන දෙපාර්තමේන්තුමය සේවා නිලධාරීන් හා ප්‍රාථමික මට්ටමේ දෙපාර්තමේන්තුමය සේවා නිලධාරීන් | තනතුර සඳහා පත්වීම |
| | i. අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක<br>ii. අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක<br>iii. අතිරේක පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක<br>iv. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ විෂය විශේෂඥ<br>v. නියෝජ්‍ය පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක<br>vi. නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක (අනුමත සංඛ්‍යාව 06 ප්‍රධාන කාර්යාලය 01 දිස්ත්‍රික් කාර්යාලවල 05)<br>vii. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂක<br>viii. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br>ix. දේශ්‍ය ආයුර්වේද වෛද්‍ය සේවා නියෝජ්‍ය කොමසාරිස් | තනතුර සඳහා පත්වීම |
| ප්‍රධාන ලේකම් | i. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂක<br>ii. නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (අනුමත සංඛ්‍යාව 06 ප්‍රධාන කාර්යාලය 01 දිස්ත්‍රික් කාර්යාලවල 05)<br>iii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂක<br>iv. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br>v. පළාත් සහකාර සමූපකාර සංවර්ධන කොමසාරිස්<br>vi. පළාත් නීති නිළධාරීන්<br>vii. පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා - පන්තිය -2<br>viii. පළාත් තක්සේරුකරුවන් | ස්ථාන මාරුව |
| | i. අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br>ii. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | a. විනය පාලනය |
| | ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය ඇතිව, සමස්ත ලංකා සේවයේ II ශ්‍රේණියේ, I ශ්‍රේණියේ සහ විශේෂ ශ්‍රේණියේ නිළධාරීන් අන්තර්ග්‍රහණය කර නිදහස් කිරීමේදී. | a. සහ මුදාහැරීම (පළාතෙන් පිටතට) |

| *තීරුව I*<br>*බලතල පවරා ඇති නිළධාරින්* | *තීරුව II*<br>*බලතල පවරා ඇති නිළධාරින්* | *තීරුව III*<br>*පවරා ඇති බලතල* |
|---|---|---|
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් | i. පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිළධාරීන්ගේ සේවය<br>ii. සංවර්ධන නිලධාරින්ගේ සේවය<br>iii. ශ්‍රී ලංකා තාක්ෂණික සේවය<br>iv. පළාත් තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සේවය -3 පන්තිය<br>v. දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරුවන් (පුද්ගලිකව හිමිකරුට)<br>vi. පළාත් රියදුරු සේවය<br>vii. පළාත් කාර්යාල සේවක සේවය | අ. පත්වීම<br>ආ. මාරු කිරීම<br>ඇ. විනය පාලනය<br>ඈ. සේවයෙන් පහ කිරීම |
| | එවැනි පත්කිරීම් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලබාගත් පූර්ව අනුමැතියකින් | අ. අනියම් හෝ තාවකාලික පදනම මත පත්වීම |
| පළාත් අමාත්‍යාංශ ලේකම්වරු | i. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය<br>ii. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය<br>iii. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය<br>iv. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය<br>v. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය නිළධාරීන්ගේ සේවය<br>vi. ශ්‍රී ලංකා වෛද්‍ය නිළධාරීන්ගේ සේවය (විශේෂඥ සහ විශේෂඥ නොවන) | අ. තනතුරට පත් කිරීම<br>ආ. මාරු කිරීම<br>ඇ. මූලික විමර්ශනය |
| පළාත් අමාත්‍යාංශ ලේකම්වරු | i. විශේෂ ශ්‍රේණියේ හැර අනෙකුත් ඕනෑම තෘතියික මට්ටමේ දෙපාර්තමේන්තු සේවා නිළධාරීන්<br>ii. හෙදියන්, ඖෂධ සේවා සඳහා අතිරේක වෘත්තීන්, අතුරු වෛද්‍ය සේවා මෙම සේවාවන්හි විශේෂ ශ්‍රේණිය හැර<br>iii. මාණ්ඩලික නොවන ශ්‍රේණියේ දෙපාර්තමේන්තු සේවා නිළධාරීන් සහ ප්‍රාථමික මට්ටමේ දෙපාර්තමේන්තු සේවා නිලධාරීන් | අ. පත්වීම<br>ආ. මාරු කිරීම<br>ඇ. විනය පාලනය<br>ඈ. සේවයෙන් පහ කිරීම |
| | i. ශ්‍රී ලංකා ගුරු සේවය | අ. පත්වීම<br>ආ. විනය පාලනය<br>ඇ. සේවයෙන් පහ කිරීම |
| | දෙපාර්තමේන්තු සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් පත් කිරීම. (එම පත්වීම් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලබාගත් පූර්ව අනුමැතියකින්) | අනියම් හෝ තාවකාලික පදනම මත පත්වීම |
| | i. පළාත් ජෛව වෛද්‍ය ඉංජිනේරු<br>ii. ක්ෂේත්‍ර/ කාර්යාල පාදක නිළධාරීන් විශේෂ ශ්‍රේණිය<br>iii. හෙද හෙදියන්ගේ විශේෂ ශ්‍රේණිය, ඖෂධවලට අතිරේ වෘත්තීන්, පරිපූරක වෛද්‍ය සේවා නිළධාරීන්<br>iv. දෙපාර්තමේන්තු සේවාවන්හි විශේෂ ශ්‍රේණිය (ප්‍රාථමික මට්ටම හැර) | ආ. ස්ථාන මාරු |
| | i. ශ්‍රී ලංකා විදුහල්පති සේවය | අ. තනතුරට පත්කිරීම<br>ආ. මාරු කිරීම<br>ඇ. විනය පාලනය<br>ඈ. සේවයෙන් පහ කිරීම |
| | i. ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය | අ. තනතුරට පත්කිරීම<br>ආ. විනය පාලනය<br>ඇ. සේවයෙන් පහ කිරීම |
| | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සහ උතුරු පළාත්සභාවේ තනතුරු සඳහා මුදාහරින ලද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ හැර) | විනය පාලනය |
| | සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව [අනුමත සේවක සංඛ්‍යාව - 14 (ප්‍රධාන කාර්යාලය - 3, යාපනය -3, මන්නාරම - 2, වවුනියාව - 2, මුලතිව් - 2, කිලිනොච්චි - 2)] | පත්වීම |

| *තීරුව I* *බලතල පවරා ඇති නිළධාරීන්* | *තීරුව II* *බලතල පවරා ඇති නිළධාරීන්* | *තීරුව III* *පවරා ඇති බලතල* |
|---|---|---|
| පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් | i. ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය<br>ii. ශ්‍රී ලංකා ගුරු සේවය<br>iii. මාන්ඩලික නොවන ශ්‍රේණියේ දෙපාර්තමේන්තු සේවා නිළධාරීන් සහ ප්‍රාථමික මට්ටමේ දෙපාර්තමේන්තු සේවා නිළධාරීන් (ඔවුන්ගේ අදාළ පරිපාලන විෂය පථය තුළ) | මාරු කරන්න |
| පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් | i. ඕනෑම නිළධාරියෙකු හෝ සේවකයින්ගේ වැඩ තහනම් කිරීම. (ආයතන සංග්‍රහය XLVIII පරිච්ඡේදයේ 31 වගන්තියට අනුව දෙපාර්තමේන්තුවේ සේවය කරන) සහ ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 25:5 වගන්තියට අනුව) පත්කිරීම/විනය බලය දැනුවත් කිරීම | අ.විනය පාලනය (තහනම් කිරිම) |
| මහ නගර සභා කොමසාරිස්වරුන්, නගර සභා සහ ප්‍රාදේශීය සභා ලේකම්වරුන් | අදාළ පළාත් පාලන ආයතනයන්හි ප්‍රාථමික සහ ද්විතීයික මට්ටමේ සේවකයින් (පළාත් පාලන කොමසාරිස්වරයාගේ දැනුම් සහිතව) | අ. පත්වීම<br>ආ. මාරු කිරීම<br>ඇ. විනය පාලනය<br>ඈ. සේවයෙන් පහ කිරීම |
| ප්‍රාදේශීය ප්‍රධානීන් (ප්‍රාදේශීය /දිස්ත්‍රික් / කළාප මට්ටමින්) | (පළාත් ඒකාබද්ධ සේවය හැර) සුළු ශ්‍රේණියේ සේවකයින් මාරු කිරීමේ බලය - ඔවුන්ගේ සෘජු පරිපාලන විෂය පථය යටතේ. | අ. ස්ථාන මාරු කිරීම |
| | ශ්‍රී ලංකා ගුරුසේවය - අදාළ කලාපය තුළ ඇති පාසලකට පමණක්, අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. | |

EOG 03 - 0098

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.